කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

## 2022 අප්‍රේල් මස 09 දින සඳහා කාලගුණ අනාවැකිය
## 2022 අප්‍රේල් මස 08 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**දිවයිනට නැගෙනහිර දෙසින් පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් පවතින වැසි තත්ත්වය ඉදිරි දින කිහිපයේ (09 සහ 10 දිනවල) තව දුරටත් බලාපොරොත්තුවේ.**

දිවයිනේ බොහෝ ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

මධ්‍යම, සබරගමුව, බස්නාහිර සහ ඌව පළාත්වලත්ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට **මි.මී. 100 ට වැඩි** තද වැසි ද සෙසු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට **මි.මී. 50 ට වැඩි** තරමක තද වැසි ද ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

දෘශ්‍ය ලෙස සූර්යයා උතුරට ගමන් කිරීමේදී සූර්යයා, අප්‍රේල් මස 05 සිට 15 දක්වා දිනවලදී ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්ෂාංශ වලට සෘජුවම ඉහලින් පවතී. හෙට දින (09) දහවල් 12:12 ට හලාවත, මහකෙළිය, වැලිවිට (මාතලේ දිස්ත්‍රික්කය ), පුල්ලුමලෙයි, කල්කුඩා, සහ කුරුක්කල්මඩම් යන ප්‍රදේශ වලට හිරු මුදුන් වනු ඇත.

## WEATHER FORECAST FOR 09 APRIL 2022
## Issued at 12.00 noon on 08 APRIL 2022

**Due to the low-level atmospheric disturbance to the east of Sri Lanka, prevailing showery condition is expected to continue during next few days (09th and 10$^{th}$).**

Showers or thundershowers will occur at several places over most parts of the island.

Heavy showers **above 100 mm** can be expected at some places in Central, Sabaragamuwa, Western and Uva provinces and in Galle and Matara districts. Fairly heavy showers **above 50 mm** can be expected at some places elsewhere.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

On the apparent northward relative motion of the sun, it is going to be directly over the latitudes of Sri Lanka from 05$^{th}$ to 15$^{th}$ of April this year. The nearest areas of Sri Lanka over which the sun is overhead tomorrow (09$^{th}$) are Chilaw, Mahakeliya, Weliwita (Matale District), Pullumalai, Kalkudah and Kurukkalmadam at about 12:12 noon.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

### ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
### 2022 අප්‍රේල් මස 08 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**දිවයිනට නැගෙනහිර දෙසින් පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් ගාල්ල සිට හම්බන්තොට සහ මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 40-50 දක්වා වැඩිවිය හැකි බැවින් ධීවර සහ නාවික ප්‍රජාව මේ සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙසත් ඉදිරි කාලගුණ අනාවැකි පිළිබඳව අවධානයෙන් පසු වන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ. ගාල්ල සිට හම්බන්තොට සහ මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (40-50)** දක්වා වැඩිවිය හැක.

**මුහුදේ ස්වභාවය:**

ගාල්ල සිට හම්බන්තොට සහ මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ. සෙසු මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ පවතී.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
### Issued at 12.00 noon on 08 April 2022

**Due to the low-level atmospheric disturbance to the east of Sri Lanka, winds speed can increase upto (40-50) kmph at times in the sea areas off the coast extending from Galle to Trincomalee via Hambantota and Batticaloa. The fishing and naval communities are advised to be vigilant in this regard and requested to be attentive to future weather forecasts.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at several places in the sea areas around the island.

**Winds:**

Winds will be south-westerly or variable in direction and wind speed will be (20-30) kmph. Winds speed can increase upto **(40-50) kmph** at times in the sea areas off the coast extending from Galle to Trincomalee via Hambantota and Batticaloa.

**State of Sea:**

The sea areas off the coast extending from Galle to Trincomalee via Hambantota and Batticaloa will be fairly rough at times. The other sea areas around the island will be slight.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි